මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை.
The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.:
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2025.02.10

## මාධ්‍ය නිවේදනය

### රාජ්‍ය ආයෝජන අධීක්ෂණ හා ඇගයීම් කමිටුව පිහිටුවීම

රාජ්‍ය ආයෝජන මඟින් සිදුකරනු ලබන විවිධ ව්‍යාපෘති අධීක්ෂණයට හා ඇගයීමට ලක්කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරුන් දෙදෙනකු, ජනාධිපති ලේකම් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්වරයෙකු, මුදල්, ක්‍රම සම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්වරයෙකු, අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලයේ අතිරේක ලේකම්වරයෙකු, හා භාණ්ඩාගාරය යටතේ පවතින ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ දෙපාර්තමේන්තු හයක අධ්‍යක්ෂ ජනරාල්වරු හය දෙනෙකුගෙන් සමන්විත කමිටුවක්, 2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 44 (3) වගන්තිය අනුව, මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා විසින් අංක 24/2313/804/037 හා 2024.12.30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව පත්කර ඇත. එහි සම සභාපතිත්වය ජනාධිපති ලේකම්වරයා විසින් පත්කරනු ලබන ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්වරයා සහ අමාත්‍යාංශ ලේකම්වරයෙක් විසින් දරනු ලබන අතර ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා එහි කැඳවුම්කරු/ලේකම් ලෙස ක්‍රියා කරනු ලබයි.

මෙම කමිටුව පිහිටුවීමේ ප්‍රධාන පරමාර්ථ පහත සඳහන් පරිදි වේ.

- ව්‍යාපෘති කළමනාකරණයේ දී ඇතිවන දුර්වලතා හා ප්‍රමාදයන් අවමකිරීම
- පැන නගින විවිධ ගැටළු සඳහා උපාය මාර්ගිකව ප්‍රතිචාර දැක්වීම/විසඳුම් ලබාදීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා පහසුවන යෝජනා ඉදිරිපත් කිරීම
- රාජ්‍ය ආයෝජන / ව්‍යාපෘති සම්බන්ධයෙන් අදාල වන නිර්දේශ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම
- අමාත්‍ය මණ්ඩල තීරණ මඟින් කමිටුවට යොමුකරන යෝජනා සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම
- සංවර්ධන වැඩසටහන්වලට සම්බන්ධ වන තෙවන පාර්ශ්වයන් කැඳවා අවශ්‍ය අවස්ථාවල සාකච්ඡා පැවැත්වීම
- ඇගයීම් ක්‍රියාවලියක් අවශ්‍ය අවස්ථාවන්හි දී ඒ සඳහා යොමුකිරීම.

ඒ අනුව සංවර්ධන ව්‍යාපෘති /වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී සිදුවන ප්‍රමාද දෝෂ/ අඩුපාඩු වළක්වා ගැනීමෙන් නියමිත කාල රාමුව තුළ අපේක්ෂිත ප්‍රතිලාභ ජනනය කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ හා ව්‍යාපෘති කළමනාකරණයේ විෂය පථයෙන්, පාලනයෙන් බැහැර සාමූහික ප්‍රයත්නයක් දැරිය යුතු අවස්ථාවල දී, ඒ සඳහා කඩිනම් ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය සම්බන්ධීකරණයට, උපදෙස් ලබාදීමට, උපායමාර්ගික තීරණ ගැනීමට මෙන්ම, ව්‍යාපෘතිවල සුමට ක්‍රියාකාරීත්වයට බලපා ඇති විවිධ ගැටළු මගහරවා ගැනීම පිණිස ව්‍යාපෘති කළමනාකරණයට හා අධීක්ෂණයට අදාලව ගතයුතු ක්‍රියා මාර්ග යෝජනා කිරීම හා අවශ්‍ය අවස්ථාවල දී රාජ්‍ය ප්‍රාග්ධන ආයෝජන සම්බන්ධයෙන් අදාළ වන නිර්දේශ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා අධිකාරි බලයක් සහිත ස්ථාවර ක්‍රමවේදයක් මෙමඟින් තහවුරු වනු ඇත.